## ශ්‍රී ලංකා පොල් පර්යේෂණ ආයතනය - 2015

---

ශ්‍රී ලංකා පොල් පර්යේෂණ ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ 43 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා පොල් පර්යේෂණ ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

(i) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.163,024,641 ක්වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) ආයතනය විසින් රු. 2,822,373 ක් වටිනා පුස්තකාල පොත් හා වාර සඟරා ක්ෂය කිරීම සම්බන්ධයෙන් ප්‍රතිපත්තියක් හඳුන්වාදී ක්ෂය කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) තබ්බෝව ආදර්ශ ගොවිපල පිහිටි අක්කර 05 ක් වූ ඉඩමේ වටිනාකම ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) විදේශ ප්‍රදාන වශයෙන් ලැබී ඇති රු. 6,616,827 ක මුදලින් ස්ථාවර වත්කම් මිලදීගෙන තිබූ අතර එම වත්කම් වලට අදාල ක්‍රමක්ෂය ගැලපීම් කර නොතිබුණි.

#### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව රඳවා ගැනීමේ බදු මුදල් ශේෂය අදාල ලේඛනය සමඟ සැසඳීමේදී රු. 417,428 ක වෙනසක් විය.

#### 2.2.4 ලැබිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ණයගැති කාල විශ්ලේෂණයට අනුව වසර 5කට වඩා පැරණි ණය ශේෂ වටිනාකම රු.554,737 ක් වූ අතර එම ණය ශේෂ අයකර ගැනීමට ආයතනය විසින් ක්‍රියාකර නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශනවල අනිකුත් ජංගම වත්කම් යටතේ ආයතන 14 කින් රු. 245,650 ක්වූ වසර ගණනාවක සිට පැවත එන ලැබිය යුතු ආරක්ෂිත තැන්පතු ශේෂය අයකර ගැනීමට ආයතනය විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු පහත සඳහන් විෂයයන් සම්බන්ධයෙන් ඒවා ඉදිරියෙන් දක්වා තිබූ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.

| | විෂයය | වටිනාකම | නොසැපයූ ලිඛිත සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | ආරක්ෂිත තැන්පතු | 187,827 | ශේෂ සනාථන ලිපි |
| (ආ) | ණයගැතියෝ | 11,783,524 | |
| (ඇ) | ණය හිමියෝ | 5,406,344 | |

**2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 756 ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.2,822,373 ක් වූ පුස්තකාල පොත් හා වාර සඟරා පොත්වලට අදාලව වාර්ෂික සමීක්ෂණ සිදුකර වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.45,519,601 ක අතිරික්තයක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ රු. 70,181,702 ක අතිරික්තයක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු. 24,662,101 ක පිරිහීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ වැටුප් වේතන හා සේවක ප්‍රතිලාභ වියදම් රු.32,935,808 කින් වැඩිවීම පර්යේෂණ මධ්‍යස්ථාන වියදම් රු. 6,956,799 කින් වැඩිවීම සහ අනෙකුත් ආදායම් රු. 14,546,456 කින් අඩුවීම අතිරික්තය අඩුවීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

ඉකුත් වර්ෂ කිහිපයක මූල්‍ය ප්‍රතිඵල පිළිබඳ සැලකීමේදී 2011 වර්ෂයේදී රු. 7,998,680 ක් වූ ඌනතාවය 2012 වර්ෂය වන විට රු. 59,537,758 ක ඌනතාවයක් ලෙස වර්ධනය වී පසුව ක්‍රමානුකූලව ලාභදායි තත්ත්වයකට පත්වී තිබුණි. සේවක පාරිශ්‍රමික, රජයට ගෙවූ බදු හා ස්ථාවර වත්කම් සඳහා ක්ෂය ගැලපීම් කිරීමෙන් පසු ආයතනයේ දායකත්වය 2011 වර්ෂයේ රු. 116,578,448 වූ අතර එය ක්‍රමිකව වර්ධනය වී 2015 වර්ෂය වන විට රු. 256,602,876 ක දායකත්වයක් බවට පත්වී තිබුණි.

**3.2 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

මණ්ඩලය විසින් බාහිර ආයතන හා පුද්ගලයන් 09 දෙනෙකුට එරෙහිව එකතුව රු.16,716,899 ක වන්දි ඉල්ලුම් කරමින් අධිකරණවල නඩු 09 ක් පවරා තිබූ අතර බාහිර පාර්ශවකරුවෙකු විසින් ආයතනයට එරෙහිව නඩුවක් පවරා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

1971 අංක 46 දරන පොල් සංවර්ධන පනත අනුව ආයතනයේ කාර්යයන් පහත දැක්වේ.

- පොල් ගස්වල වැවීම හා පොල් වගාව, පොල් ඉඩම්වල වෙනත් වගා ඇති කිරීම හා සත්ව පාලනයෙහි නියුක්ත වීම සම්බන්ධයෙන් විද්‍යානුකූල පර්යේෂණ පැවැත්වීම හා දියුණු කිරීම සහ රෝග හා පළිබෝධ නිවාරණය කිරීම හා සුව කිරීම.

- පර්යේෂණ ආයතන, අත්හදා බැලීමේ ස්ථාන හා තවාන් පිහිටුවීම, පවත්වාගෙන යාම, පොල් නිෂ්පාදන සකස් කිරීම, ප්‍රයෝජනයට ගැනීම සම්බන්ධයෙන් විද්‍යාත්මක පර්යේෂණ පැවැත්වීම හා දියුණු කිරීම හා නියාමක යන්ත්‍රාගාර පිහිටුවීම, නඩත්තු කිරීම හා අත්හදා බැලීමේ උපකරණ නිර්මාණය කිරීම.

- පොල් කර්මාන්තයට සහාය වීම සඳහා උපදේශක හා ව්‍යාප්ති සේවකයින් පුහුණු කිරීම හා පොල් කර්මාන්තය පිළිබඳ ශිල්පීය ස්වභාවයකින් යුත් සියලුම කරුණු සම්බන්ධයෙන් මඟ පෙන්වීම හා උපදෙස් දීම.

ඉහත අරමුණු ඉටුකර ගැනීමේදී සම්බන්ධව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

### (අ) පොල් ඵලදාව

2015 වර්ෂයේ ජාන සම්පත් මධ්‍යස්ථාන 04 ක් පර්යේෂණ මධ්‍යස්ථාන 06 ක් සහ ආදර්ශ ගොවිපලක් පොල් පර්යේෂණ ආයතනය මඟින් පවත්වාගෙන යමින් තිබුණි. එම වතුවල පොල් ඵලදාව පිළිබඳව තොරතුරු පහත දැක්වේ.

| ජාන සම්පත් / පර්යේෂණ මධ්‍යස්ථානය | ඇස්තමේන්තුගත ඵලදාව (ගෙඩි) | | තත්‍ය ඵලදාව (ගෙඩි) | | ඇස්තමේන්තුගත ඵලදාව හා තත්‍ය ඵලදාව අතර විචලනය 2015 | | පසුගිය වර්ෂයට සාපේක්ෂව තත්‍ය ඵලදාවේ විචලනය | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2015 | 2014 | 2015 | 2014 | ගෙඩි | ප්‍රතිශතය | ගෙඩි | ප්‍රතිශතය |
| බණ්ඩිරිප්පුව | 725,000 | 710,000 | 588,206 | 792,279 | (136,794) | (23) | (204,073) | (26) |
| රත්මලාගාර | 650,000 | 665,000 | 616,902 | 676,144 | (33,098) | (5) | (59,242) | (9) |
| අඹකැලේ | 1,300,000 | 1,290,000 | 1,611,559 | 1,424,155 | 311,559 | 19 | 187,404 | 13 |
| පල්ලම | 570,000 | 465,000 | 703,720 | 630,840 | 133,720 | 19 | 72,880 | 12 |
| පොත්තුකුලම | 700,000 | 740,000 | 774,367 | 747,838 | 74,367 | 10 | 26,529 | 4 |
| මාකඳුර | 475,000 | 490,000 | 336,042 | 428,920 | (138,958) | (41) | (92,878) | (22) |
| වල්පිට | 105,000 | 92,000 | 112,684 | 107,963 | 7,684 | 7 | 4,721 | 4 |
| මාදුරුඔය | 649,399 | 610,000 | 588,869 | 776,226 | (60,530) | (10) | (187,357) | (24) |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **දූන්කන්නාව** | **55,215** | **40,500** | **36,356** | **51,248** | **(18,859)** | **(52)** | **(14,892)** | **(29)** |
| **මිද්දෙනිය** | **71,500** | **50,000** | **57,594** | **83,050** | **(13,906)** | **(24)** | **(25,456)** | **(31)** |
| **තබ්බෝව** | **35,000** | **-** | **30,614** | **31,265** | **(4,386)** | **(14)** | **(651)** | **(2)** |
| | **---------------** | **-------------** | **-------------** | **-------------** | **------------** | | **----------** | |
| | **5,336,114** | **5,152,500** | **5,456,913** | **5,749,928** | **120,799** | | **200,137** | |
| | **========** | **=======** | **=======** | **=======** | **=======** | | **=====** | |

සමාලෝචිත වර්ෂයේ බණ්ඩිරිප්පුව, රත්මලාගාර,මාකඳුර, මාදුරුඔය, දූන්කන්නාව, මිද්දෙනිය සහ තබ්බෝව යන වතුවල තත්‍ය ඵලදාව ඇස්තමේන්තුගත ඵලදාවට වඩා අඩුවීම සියයට 5 සිට සියයට 52 දක්වා පරාසයක් දක්වා විහිදී තිබුණි.

**(ආ) අක්කරයක ඵලදාව හා ගසක වාර්ෂික සාමාන්‍ය ඵලදාව.**

**---------------------------------------------------------**

සමාලෝචිත වර්ෂයේ ජාන සම්පත් මධ්‍යස්ථාන 04ක, පර්යේෂණ මධ්‍යස්ථාන 06 ක සහ ආදර්ශ ගොවිපලක අක්කරයක පොල් ඵලදාව සම්බන්ධයෙන් තොරතුරු පහත දැක්වේ.

| ජාන සම්පත්/පර්යේෂණ මධ්‍යස්ථානය | ඵල දරන වගාව සහිත භූමි ප්‍රමාණය (අක්කර) | ඵල දරන ගස් සංඛ්‍යාව | වැටුණු පොල් (ගෙඩි) | මුළු වාර්ෂික අස්වැන්න (ගෙඩි) | ගසක වාර්ෂික සාමාන්‍ය අස්වැන්න (ගෙඩි) | අක්කරයක ඵලදාව (ගෙඩි) | වැටුණු පොල් ප්‍රතිශතය සියයට |
|---|---|---|---|---|---|---|---|
| ------------------- | --------- | -------- | ----------- | ---------- | --------- | ----------- | ----------- |
| බණ්ඩිරිප්පුව | 287 | 10,706 | 49,236 | 588,206 | 55 | 2,053 | 8 |
| රත්මලාගාර | 225 | 10,598 | 88,903 | 616,902 | 58 | 2,737 | 14 |
| අඹකැලේ | 329 | 16,917 | 147,289 | 1,611,559 | 95 | 4,906 | 9 |
| පල්ලම | 498 | 14,246 | 401,549 | 703,720 | 49 | 1,413 | 57 |
| පොත්තුකුලම | 209 | 9,158 | 183,735 | 774,367 | 85 | 3,705 | 24 |
| මාකඳුර | 127 | 4,200 | 38,815 | 336,042 | 80 | 2,646 | 12 |
| වල්පිට | 41 | 1,684 | 62,819 | 112,684 | 67 | 2,750 | 56 |
| මාදුරුඔය | 195 | 7,546 | 175,019 | 588,869 | 78 | 3,012 | 30 |
| දූන්කන්නාව | 23 | 862 | 5,863 | 36,356 | 42 | 1,562 | 16 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| මිද්දෙණිය | 71 | 1,281 | 638 | 57,594 | 45 | 817 | 1 |
| තබ්බෝව | 5 | 272 | 4,195 | 30,614 | 112 | 6,111 | 14 |
| | --------- | ---------- | ------------ | ------------ | | | |
| | 2010 | 77,470 | 1,158,061 | 5,456,913 | | | |
| | ====== | ====== | ======== | ======= | | | |

(i) බණ්ඩිරිප්පුව, රත්මලාගාර, පල්ලම, දූන්කන්නාව සහ මිද්දෙණිය වතුවල වාර්ෂික සාමාන්‍ය අස්වැන්න ගෙඩි 60 කටත් වඩා අඩුවෙන් පැවතුණි.

(ii) අක්කරයකට සාමාන්‍ය පොල් ඵලදාව ගෙඩි දළ වශයෙන් 4,500 සිට 5,000 අතර විය යුතු වුවත් ආයතනය සතු වතු 11 න් වතු 09 කම අක්කරයක පොල් ඵලදාව පොල්ගෙඩි 817 සිට 3705 දක්වා පරාසයක පැවතුණි.

**(ඇ) පර්යේෂණ ව්‍යාපෘතිවල ප්‍රගතිය පරීක්ෂා කිරීම**

**-----------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නිමකළ යුතු ව්‍යාපෘති 16 ක් නිමකර නොතිබූ අතර එම ව්‍යාපෘති අතරින් 08 ක කාර්යසාධනය සියයට 10 සිට සියයට 50 අතර පරාසයක පැවතුණි.

(ii) 2013 වර්ෂයේ ආරම්භ වී 2015 වර්ෂයේ අවසාන වීමට නියමිතව තිබූ පාම් ඔයිල් වගාව පිළිබඳ සමාජ ආර්ථික සමීක්ෂණය (Socio – Economic impact Assessment of the Oil Palm Cultivation) හා සමාලෝචිත වර්ෂය තුළදී ආරම්භ කිරීමට සැලසුම්කර තිබූ කාබනික කෘෂිකාර්මික වගා ක්‍රමවල අගය ඉහළ දැමීමේ විශ්ලේෂණය, විවිධ ශාක හා බෝගයන්හි අතුරු ඵල මගින් නිපදවන ලද ජෛව අඟුරුවල ගුණාංග සංසන්දනය කිරීම හා පොල් වගාවන්හි අතුරුබෝග ලෙස රෙසින බෝගයන්හි වර්ධන පරාමිතියන් අධ්‍යයනය කිරීම යන ව්‍යාපෘති 03 ක් 2015 වර්ෂය අවසාන වන තෙක්ම ආරම්භ කර නොතිබුණි.

**4.2 අරමුදල් ඌන උපයෝජනය**

**------------------------------**

ලෝක වන වගා ව්‍යාපෘතිය සඳහා 2014 දෙසැම්බර් 24 දින කින්යා ඇග්‍රෝ වන ව්‍යාපෘතිය මගින් (kinya agro forestry project) ලබාදුන් රු. 2,021,532 ක මුදල සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අදාල ව්‍යාපෘතිය සඳහා උපයෝජනය නොකර ජංගම ගිණුමේ තැන්පත් කර තිබුණි.

**4.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

**--------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) බණ්ඩිරිප්පුව පොල් පර්යේෂණ ආයතනයේ ඇති පිරිවැය රු. 259,000 ක් වූ කොහු නිෂ්පාදන යන්ත්‍රය වසරකට වැඩි කාලයක් පුරා නිෂ්පාදන කටයුතුවල යොදවා නොතිබුණි.

(ආ) පොල් කටු අඟුරු නිෂ්පාදනයේදී පිටවන තාපය පරිසරයට මුදා නොහැර එම තාපය යොදාගෙන කොප්පරා වියළීම අරමුණු කොටගෙන රු.1,719,250 ක වියදමක් දරා තාප සුරැකුම් ඒකකයක් 2008 වර්ෂයේ ආරම්භ කර තිබුණද එය 2012 වර්ෂයේ සිට උපයෝජනය නොකර නිෂ්ක්‍රීයව පැවතුණි.

(ඇ) සුළු හා ගෘහස්ථ කර්මාන්තයේ නියැලෙන්නන් දිරිමත් කිරීමේ අරමුණින් පොල් සංවර්ධන අධිකාරිය විසින් ලබා දී තිබූ රු. 161,500 ක් වටිනා ලණු අඹරන අත් යන්ත්‍ර කට්ටල 19 ක් 2013 වර්ෂයේ සිට භාවිතා කිරීමෙන් තොරව නිශ්ක්‍රීයව පැවතුණි.

(ඈ) පුනරීන්වල බීජ පොල් උයනක් පිහිටුවීමේ අරමුණින් මිලදී ගෙන තිබූ භාණ්ඩ අතරින් රු. 1,197,187 ක් වටිනා භාණ්ඩ අදාල කාර්යය ඉටු කිරීමට අපොහොසත් වීම හේතුවෙන් වර්ෂයක පමණ කාලයක සිට කිසිදු භාවිතයකින් තොරව නිෂ්ක්‍රීයව පැවතුණි.

## 4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

-----------------------------

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 391 ක් වූ අතර තත්‍ය සේවක සංඛ්‍යාව 276 ක් වූයෙන් තනතුරු 34 ක් සඳහා පුරප්පාඩු 115 ක් පැවතුණි. එය අනුමත සේවක සංඛ්‍යාවෙන් සියයට 30 කි. පර්යේෂණ නිලධාරි, වතු අධිකාරි, ආදි තනතුරුවල පුරප්පාඩු පැවතීමෙන් පොල් පර්යේෂණ ආයතනයේ මූලික අරමුණු වන පර්යේෂණ කටයුතු සාර්ථකව සිදු කරගැනීමට අහිතකර ලෙස බලපා තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-------------------------------------------

## 5.1 සංයුක්ත සැලැස්ම

---------------------

2003 ජුනි 02 දිනැති හා අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5 වගන්තිය ප්‍රකාරව ආයතනයේ දර්ශනය හා මෙහෙවර ඉටුකර ගැනීම සඳහා වර්ෂ 03 කට නොඅඩු කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් සකස් කළ යුතු වුවත් ආයතනය විසින් 2015 වර්ෂයේ සිට 2018 වර්ෂයට අදාලව සංයුක්ත සැලැස්මක් 2015 දෙසැම්බර් 31 තෙක් සකස් කර නොතිබුණි.

## 5.2 ක්‍රියාකාරී සැලැස්ම

---------------------

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2015 අප්‍රේල් 07 දින ක්‍රියාකාරී සැලැස්ම අනුමත කර තිබූ අතර එම ක්‍රියාකාරී සැලැස්මට අනුව පර්යේෂණ අංශ, පර්යේෂණ සංවර්ධන සහ නඩත්තු අංශ වල ලඟා කරගත් ප්‍රගති මට්ටම් සලකා බලා නැවත ක්‍රියාකාරී සැලැස්ම යාවත්කාලීන කර නොතිබුණි.

## 5.3 වාර්ෂික වාර්තා සභාගත කිරීම

----------------------------------

ආයතනය විසින් 2013 වර්ෂයට අදාල වාර්ෂික වාර්තා සභාගත කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

-------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| | ---------------------------- | ------------ |
| (අ) | මානව සම්පත් කළමනාකරණය | ආයතනයේ පවතින පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් පරිපාටිය අනුව අදාල නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කර නොතිබීම. |
| (ආ) | වතු කළමනාකරණය | පොල් එලදාව වැඩි කිරීමට හා නව පොල් ප්‍රභේද හඳුන්වාදීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබීම. |
| (ඇ) | වත්කම් පාලනය | සියළුම වාහන වත්කම් ලේඛනවල සටහන් නොකිරීම හා අදාල ලිපිගොනු නඩත්තු කර නොතිබීම, වත්කම් ඉවත් කිරීමට අදාල තොරතුරු පවත්වාගෙන නොතිබීම. |
| (ඈ) | අභ්‍යන්තර පාලනය | ගෙවීම් කිරීමේදී වියදම් අනුමත කිරීම, සහතික කිරීම හා ගෙවීම් කිරීම නිලධාරීන් කිහිප දෙනෙකු අතරේ බෙදා නොහැර එකම නිලධාරියකු විසින් ඉටුකළ අවස්ථා අනාවරණය වීම. |